කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2019

2023 අප්‍රේල්/ මැයි

සමාජීය විද්‍යා පීඨය

පුරාවිද්‍යාව (පැරණි නිර්දේශය)

**පුරාවිද්‍යා මූලධර්ම හා විධි නියම ARCH – E 1025**

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි.** **කාලය : පැය 03 යි.**

---

01. පුරාවිද්‍යා විෂය හඳුන්වා දී, එහි ප්‍රධාන මූලාශ්‍ර පැහැදිලි කරන්න.

02. "පුරාවිද්‍යා ද්‍රව්‍යමය සංස්කෘතිය හැදෑරිය හැක්කේ බහුවිෂයයික ප්‍රවේශ අධ්‍යයනයක් මගිනි." මෙම ප්‍රකාශය උදාහරණ සහිතව විස්තර කරන්න.

03. පුරාවිද්‍යා ක්ෂේත්‍ර ගවේෂණයක ප්‍රධාන විධික්‍රම සාකච්ඡා කරන්න.

04. පුරාවිද්‍යා කැණීමක දී සංසිද්ධි අංක ලකුණු කිරීම හා හැරිස් මෙට්‍රික්ස් වාර්තාගත කිරීමේ වැදගත්කම පැහැදිලි කරන්න.

05. පුරාවිද්‍යා සුවිගත කිරීම යනු කුමක්ද? යන්න හඳුන්වා දී, ක්ෂේත්‍ර පුරාවිද්‍යා කටයුතු සඳහා සුවිගත කිරීම යොදාගන්නා ආකාරය විස්තර කරන්න.

06. පුරාවිද්‍යා පර්යේෂණයක් සාර්ථකව අවසන් කිරීමට කාලනිර්ණය කෙතරම් වැදගත්වේද? යන්න කෙරෙහි අවධානය යොමු කරමින් විද්‍යාත්මක කාලනිර්ණ ක්‍රම දෙකක් පිළිබඳ සාකච්ඡා කරන්න.

07. "අනීතික පුරාවස්තු වෙළෙඳාම යම් රටක පුරාවිද්‍යා උරුමයට සිදුකරන බලපෑම කවරේද?" ශ්‍රී ලංකාව ඇසුරෙන් මෙම ප්‍රවේශය විභාග කරන්න.

08. කෞතුකාගාර සංස්කෘතිය යනු කුමක්ද? සාර්ථක කෞතුකාගාර ප්‍රදර්ශනයක් සංවිධානය කිරීමේ දී අනුගමනය කළයුතු විධික්‍රම විස්තර කරන්න.

********************************